# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2416/04 - 2024 දෙසැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2024.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත (420 වන අධිකාරය)**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවෙහි 2 වන අනු ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතෙහි (420 වැනි අධිකාරය) 2 වැනි වගන්තිය, 5 වැනි වගන්තිය සහ 21C වැනි වගන්තිය සමඟ කියවිය යුතු 55 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

**අනුර කුමාර දිසානායක,**
ජනාධිපති.

2024 දෙසැම්බර් මස 24 වන දින,
කොළඹ දී ය.

2024 නොවැම්බර් මස 21 වන දින පැවති අංක MF/PE/017/CM/2024/222 දරන අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් පවරා ගන්න ලද ණය ශේෂයෙහි ශ්‍රී ලංකා රුපියල් වලින් වන ණය පියවීමේ පහසුකම වෙනුවෙන් පවතින ණය ශේෂයට සහ පොලී වටිනාකමට සමාන වන මුදලක් වන රුපියල් 262,582,862,854.00 ක් සඳහා 2026, 2028, 2030, 2032 සහ 2034 වසර වලදී කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර 05 ක් මහජන බැංකුව වෙත නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

1937 අංක 07 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතේ 55 වන වගන්තිය සමඟ කියවිය යුතු 2 වන වගන්තිය, 5 වන වගන්තිය සහ 21C වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන විෂයය භාර අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, පහත රෙගුලාසි සම්පාදනය කරමි.

1A - G 43392 - 07 (2024/12)

*සැ.යු.- මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**නියෝග**

1. මෙම නියෝග 2024 අංක 2 දරන "ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ශ්‍රී ලංකා රජයේ ශේෂ පත්‍රයට පැවරූ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය ප්‍රතිව්‍යූහගත කිරීමේදී ශ්‍රී ලංකා රුපියල් වටිනාකම් සහිත සුරැකුම්පත් නිකුත් කිරීම මගින් ශ්‍රී ලංකා රුපියල් වලින් ණය පියවීම ක්‍රියාත්මක කිරීම)" නියෝග ලෙස දැක්විය හැකිය.

2. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සහ රාජ්‍ය ණය ලේඛකාධිකාරීවරයා වෙත මම මෙයින් ප්‍රකාශ කර බලය පවරමි :-

   2.1 ණය පියවීම සඳහා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම වෙනුවෙන් "ශ්‍රී ලංකා රජයේ ශේෂ පත්‍රයට පැවරූ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය ප්‍රතිව්‍යූහගත කිරීම" ශීර්ෂයෙන් යුත් අංක MF/PE/017/CM/2024/222 හා 2024 අගෝස්තු 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සංදේශයෙහි (මෙතැන් සිට "ශ්‍රී ලංකා රුපියල් වලින් ණය පියවීම" ලෙස හැඳින්වෙන) පැහැදිලිව පෙන්වා ඇති පරිදි ශ්‍රී ලංකා රුපියල් වලින් ණය පියවීම ක්‍රියාත්මක කිරීමට;

   2.2 ඉහත රෙගුලාසි 2.1 යටතේ ප්‍රකාශ කර අවසර දී ඇති පරිදි ශ්‍රී ලංකා රුපියල් වලින් ණය පියවීම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයක් ආඥාපනත යටතේ සකස් කර නිකුත් කිරීමට, සහ

   2.3 මෙම ආඥාපනතේ හෝ වෙනත් ඕනෑම පනතක විධිවිධාන යටතේ වෙළඳපොළ පදනම් නොවන යාන්ත්‍රණයක් මගින් දේශීය වෙළඳපොළේ භාණ්ඩාගාර බැඳුම්කර සකස් කර නිකුත් කිරීම.

3. ආඥාපනතට යටත්ව ශ්‍රී ලංකා රුපියල් වලින් ණය පියවීම ක්‍රියාත්මක කිරීමේදී නිකුත් කිරීමට නියමිත නව භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ විස්තරය, සුරැකුම්පත් හිමියන්ගේ කාණ්ඩය, සුරැකුම්පත් හිමියාගේ නිශ්චිත තොරතුරු, පොලී ගෙවීම සහ වෙනත් ගෙවීම් සිදුකළ යුතු ආකාරය සහ එවැනි භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කළ හැකි කොන්දේසි පිළිබඳ නිශ්චිත තොරතුරු රාජ්‍ය ණය ලේඛකාධිකාරීවරයාට සඳහන් කිරීමට මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාට මම මෙයින් බලය පවරමි.

4. ඉහත 2 වන සහ 3 වන නියෝග යටතේ මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් භාණ්ඩාගාර බැඳුම්කර ආඥාපනත යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි අරමුදල් සම්පාදනයකින් තොරව සකස් කර නිකුත් කිරීමට රාජ්‍ය ණය ලේඛකාධිකාරීවරයා වෙත මෙයින් තවදුරටත් බලය පවරමි.

5. මෙම රෙගුලාසි මගින් අවසර දී ඇති පරිදි භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සහ සකස් කිරීමේදී දරනු ලබන ඕනෑම වියදමක් ගෙවීම සඳහා ආඥාපනත යටතේ අවශ්‍ය භාණ්ඩාගාර බැඳුම්කර සකස් කර නිකුත් කිරීමට මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ රාජ්‍ය ණය ලේඛකාධිකාරීවරයාට මම මෙයින් බලය පවරමි.

EOG 12 - 0303

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.